# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1698/11 - 2011 මාර්තු 22 වැනි අඟහරුවාදා - 2011.03.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ, පළාත් සභාවේ 2010 අංක 07 දරන ඌව පළාත් ක්‍රීඩා ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2010 දෙසැම්බර් මස 09 වැනි දින සම්මත කරන ලදුව 2011 පෙබරවාරි මස 21 වැනි දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන,
පළාත් සභා ලේකම්,
ඌව පළාත් සභාව.

2011 පෙබරවාරි මස 25 වැනි දින,
බදුල්ල රජ වීදියේ පිහිටි
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව පළාත් 2010 අංක 07 දරන ක්‍රීඩා ප්‍රඥප්තිය**

ඌව පළාත් සීමාවන් තුළ ක්‍රීඩා සමාජ හා කොට්ඨාස, දිස්ත්‍රික්ක හා පළාත් ක්‍රීඩා සංගම්, පළාත් ක්‍රීඩා මණ්ඩල,පළාත් ක්‍රීඩා අරමුදල, පළාත තුළ ක්‍රීඩා මධ්‍යස්ථාන පිහිටුවීම සහ ලියාපදිංචි කිරීම ද ක්‍රීඩා පහසුකම් සැපයීම, සැලසුම්කරණය සහ ඒකාබද්ධ ක්‍රීඩා වැඩසටහන් විනෝද පහසුකම් සහ ක්‍රීඩා සංවර්ධනය හා දිරිගැන්වීම කෙරෙහි බලපානු ලබන හා සම්බන්ධිත කරුණු අරහයා හා ඊට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද 1997 අංක 2 දරන ඌව පළාත් ක්‍රීඩා ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහාද වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය 1973 අංක 25 දරන ක්‍රීඩා පනතට අනනුකූල වේ.

මෙය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව මගින් 2010 අංක 07 දරන ඌව පළාත් ක්‍රීඩා ප්‍රඥප්තිය ලෙස සම්මත කරනු ලැබූ කල්හි ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

1A - PG 001228— 335 (2011/03)

ලුහුඬු නාමය

1. මෙම ප්‍රඥප්තිය 2010 අංක 07 දරන ක්‍රීඩා ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලැබේ.

අරමුණු

2. ප්‍රඥප්තියෙහි දක්වා ඇති කාර්යයන් සඳහා ප්‍රඥප්තියෙහි අනුපිළිවෙලින් ඇතුලත් විධි විධානයන්ට අනුකූලව,

(1) ඌව පළාතේ පළාත් ක්‍රීඩා අරමුදල නමින් හඳුන්වනු ලබන පළාත් අරමුදලේ වෙනම ගිණුමක්,
(2) ඌව පළාතේ පළාත් ක්‍රීඩා මණ්ඩලය, දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩල හා ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩල,
(3) අමාත්‍යවරයා විසින් සංඛ්‍යාව තීරණය කරනු ලබන පරිදි කොට්ඨාස, දිස්ත්‍රික්ක හා පළාත් ක්‍රීඩා සමාජ ද,
(4) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි පළාත් ක්‍රීඩා විද්‍යායතනයක් ද පිහිටවනු ලැබිය හැක.

3. පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ -

පත් කිරීම්

(1) මෙම ප්‍රඥප්තිය යටතෙහි අමාත්‍යවරයා විසින් පනවන ලද රෙගුලාසිවලට අනුකූලව තමන් වෙත පවරන ලද රාජකාරි හා කාර්යයන් ක්‍රියාවට නැගීම පිළිබඳ වගකිව යුතුව ඇති ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියුතු පළාත් රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරියෙක් ක්‍රීඩා අධ්‍යක්ෂ ලෙස ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කළ යුතු වන්නේ ය.
(2) බලතල ක්‍රියාවට නැගීමේ දී හා රාජකාරි කටයුතු හා කාර්යයන් ඉටු කිරීමේ දී අමාත්‍යවරයා, ලේකම්වරයා විසින් නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ නියෝග අනුව ක්‍රීඩා අධ්‍යක්ෂවරයා කටයුතු කළ යුතුව ඇත.

සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ

4. සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ -

(1) මෙම ප්‍රඥප්තිය යටතෙහි අමාත්‍යවරයා විසින් පනවන ලද රෙගුලාසිවලට අනුකූලව තමන් වෙත පවරන ලද රාජකාරි හා කාර්යයන් ක්‍රියාවට නැගීම පිළිබඳ ක්‍රීඩා අධ්‍යක්ෂට සහාය වීම සඳහා වගකිව යුතුව ඇති ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියුතු පළාත් රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරියෙක් සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ ලෙස ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කළ යුතු වන්නේය.

## *I* කොටස

*පළාත් ක්‍රීඩා අරමුදල පිහිටුවීම හා පාලනය*

පළාත් ක්‍රීඩා අරමුදල් ගිණුම

5. ඌව පළාතේ ක්‍රීඩා සඳහා ආධාර දීම,උනන්දු කරවීම දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා මෙහි මින්මතු අරමුදල් ගිණුම යනුවෙන් සඳහන් කරනු ලබන හා ඌව පළාතේ ක්‍රීඩා අරමුදල් ගිණුම යනුවෙන් හැඳින්වෙන්නා වූ අරමුදල් ගිණුමක් පළාත් අරමුදලේ වෙනම ගිණුමක් වශයෙන් පිහිටවනු ලැබිය හැකිය.

6. අරමුදල් ගිණුම පාලනය -

අරමුදල් ගිණුම් පරිපාලනය

(1) අමාත්‍යවරයාගේ නියෝගවලට යටත්ව අරමුදල් ගිණුම පාලනය කිරීම සඳහා භාරකාර මණ්ඩලයක් අමාත්‍යවරයා විසින් පත්කළ යුත්තේ ය. එම භාරකාර මණ්ඩලය මතු සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(i) භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා අමාත්‍යාංශයේ ලේකම්ය
(ii) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මුල්‍ය
(iii) අමාත්‍යාංශයේ ගණකාධිකාරි
(iv) පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ
(v) පළාත් ක්‍රීඩා මණ්ඩලයේ සාමාජිකයෙකු

අරමුදල් ගිණුමට බැර කිරීම්

7. අරමුදල් ගිණුමට බැරවන මුදල් -

(1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් වරින් වර ආධාර වශයෙන් ප්‍රදානය කරනු ලැබිය හැකි සියලුම මුදල්

(2) අරමුදලේ ගිණුම් කාර්යයන් සඳහා ඌව පළාත් සභාව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලුම මුදල්
(3) පළාත් සභා පනතේ 22 වැනි වගන්තිය යටතේ රජය විසින් ලබාදෙන විදේශීය රටවලින් ආධාර වශයෙන් ලැබෙන මුදල්
(4) කිසියම් සංවිධානයක් හෝ සමාගම් හෝ යම් තැනැත්තෙකු විසින් අරමුදල් ගිණුමට කරන ලද පරිත්‍යාග වශයෙන් ලැබෙන මුදල්,
(5) අරමුදල් ගිණුමේ නමට උපචිතවන සියලුම මුදල්.

8. එසේ වුවද යම් නිශ්චිත කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමේ කොන්දේසි පිට මෙම වගන්තියේ (3), (4), (5) වගන්ති යටතේ මුදලක් ලැබුණු අවස්ථාවල ඒ මුදල් අරමුදල් ගිණුමට භාර ගැනීම සම්පූර්ණයෙන්ම අමාත්‍යවරයාගේ අභිමතය මත විය යුතු ය.

9. යම් චංචල හෝ නිශ්චල දේපලක් ප්‍රදාන වශයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව එහි කාර්යයන් සඳහා යෙදවීම පිණිස අමාත්‍යවරයා විසින් භාරගත හැකිය. චංචල හා නිශ්චල දේපල පරිත්‍යාග

10. එවැනි යම් දේපලක් අමාත්‍යවරයාගේ අභිමතය පරිදි සහ ඔහු විසින් නිශ්චය කරනු ලබන ආකාරයට විකුණා ඒ විකිණීමෙන් ලැබෙන මුදල් අරමුදලේ ගිණුමට බැර කරනු ලැබිය හැකිය.

11. භාරකාර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන අරමුදල් ගිණුමෙන් කරනු ලබන ගෙවීම් ප්‍රමාණයන් පහත පරිදි වේ. අරමුදල් ගිණුමෙන් කරනු ලබන ගෙවීම්

(1) ක්‍රීඩාවේ උන්නතියට ලබාගෙන ඇති සම්මාන වලට සැලකිලි වශයෙන් ක්‍රීඩාවලට සහභාගිවන්නන්ට සහ ඉහතදී සහභාගිවූවන්ට කරුණා සහගත ගෙවීම් වශයෙන්
(2) ඌව පළාතේ පදිංචි ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරගවලට සහභාගි වී දක්ෂතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට දිරිදීමනා වශයෙන්
(3) ඌව පළාතේ පදිංචි දක්ෂතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට විදේශයන්හි පවත්වන ක්‍රීඩා තරගවලට සහභාගිවීමේ දී දැරීමට සිදුවන වියදම් වෙනුවෙන් ආධාර කිරීම වශයෙන්
(4) ඌව පළාතේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂ මෙහෙයක් ඉටුකරන ක්‍රීඩා නිළධාරින්, පුහුණුකරුවන් , විනිසුරුවන් සහ වෙනත් පුද්ගලයින්ට සම්මාන හා දිරිදීමනා පිරිනැමීම වශයෙන්
(5) දේශීය හා විදේශීය ක්‍රීඩා පුහුණු විනිසුරු පුහුණු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගිවන ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලි සිටින්නන්ගේ වියදම් සඳහා ආධාර වශයෙන්
(6) ඌව පළාත තුළ ක්‍රීඩා සංවර්ධනය හා පුහුණු ආයතන, ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන , ක්‍රීඩා පිටි සහ ක්‍රීඩා සංකීර්ණ ඇති කිරීම නඩත්තු කිරීම, නවීකරණය කිරීම, වැඩිදියුණු කිරීම සඳහා
(7) ක්‍රීඩාවලට සහභාගි වන්නන් රක්ෂණය කිරීම සඳහා
(8) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහා
(9) පළාත තුළ ක්‍රීඩාවේ උන්නතිය සඳහා අවශ්‍ය යැයි අමාත්‍යවරයා නියම කරන වෙනත් කාර්යයන් සඳහා ද අරමුදල් ගිණුමෙන් ගෙවිය හැකිය.

12.අරමුදල් ගිණුමේ භාරකාර මණ්ඩලයේ වගකීම හා කාර්යභාරය - අරමුදල් ගිණුම් භාරකාර මණ්ඩලයේ කාර්යභාරය

(1) අරමුදල් ගිණුම් පරිපාලනය හා භාරකාරත්වය
(2) අරමුදල් රැස්කිරීම් සහ යෙදවීම් පිළිබඳ ප්‍රතිපත්ති හා කොන්දේසි සකස් කිරීම
(3) ප්‍රතිලාභින් හඳුනා ගැනීම
(4) ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව අරමුදලට මුදල් රැස්කිරීම
(5) අරමුදල් ගිණුමෙන් කරනු ලබන සියලු ගෙවීම් අනුමත කිරීම
(6) වත්කම් මිලට ගැනීම හා මුදල් ආයෝජනය
(7) එක් එක් ලිත් වර්ෂය ඉකුත්වූ පසු මාස 03 ක් ඇතුලත අරමුදල් ගිණුමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අමාත්‍යවරයාට පරිපාලන වාර්ථාවක් ඉදිරිපත් කිරීම.

13. එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු ඊලඟ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර අරමුදල් ගිණුමේ අවසාන ගිණුම පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම අමාත්‍යාංශ ලේකම්වරයාගේ වගකීම වේ.

(1) අරමුදලේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් 1971 අංක 38 දරන මුදල් පනතෙහි II වැනි කොටසේ විධිවිධාන රෙගුලාසි මගින් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අරමුදල් ගිණුමේ මුදල් පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.
(2) අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

14. අමාත්‍යවරයා විසින් හැකිතාක් ඉක්මනින් එක් එක් ලිත් වර්ෂය සඳහා වූ අරමුදල් ගිණුම් පරිපාලනය සඳහා වූ වාර්ථාවක් එම අරමුදලේ විගණනය කරන ලද එම වර්ෂයේ ගිණුම්වල පිටපතක් ද, ඒ ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්ථාව ද සමග ඌව පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර , ප්‍රධාන අමාත්‍යවරයා විසින් එම වාර්ථාව පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

## *II* කොටස

*පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩල පිහිටුවීම*

ඌව පළාත් ක්‍රීඩා මණ්ඩලය පිහිටුවීම

15. ඌව පළාතේ ක්‍රීඩා හා ශාරිරික අධ්‍යාපනය දියුණු කිරීම, සංවර්ධනය කිරීම සහ උනන්දු කිරීම පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සහ ක්‍රියාත්මක කිරීමේදී සහාය වීම පිණිස මෙහි මින්මතු පළාත් ක්‍රීඩා මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් අමාත්‍යවරයා විසින් පිහිටවනු ලැබිය හැක.

16. පළාත් ක්‍රීඩා මණ්ඩලයේ සංයුතිය-

(1) පළාත් ක්‍රීඩා මණ්ඩලය සමන්විත වනුයේ පහත සඳහන් සාමාජිකයින්ගෙනි.

(i) ඌව පළාතේ ප්‍රධාන ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලබන නිළධාරියෙකු
(ii) දිස්ත්‍රික් ලේකම්වරු
(iii) පළාත් ක්‍රීඩා විෂය භාර ලේකම්වරයා
(iv) පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ
(v) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ශාරීරික අධ්‍යාපන
(vi) පළාත් සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ
(vii) පළාත් තරුණ සේවා අධ්‍යක්ෂ
(viii) පළාතේ පළාත් පාලන කොමසාරිස්
(ix) දිස්ත්‍රික් ක්‍රීඩා නිළධාරිවරු
(x) නියෝජ්‍ය පොලිස්පති - ඌව
(xi) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මණ්ඩල වලින් හඳුනාගන්නා ලද ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියෝජිතයින් 04 ක්.
(xii) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඌව පළාත් සභාව නියෝජනය කරනු ලබන මහජන නියෝජිතයින් 03ක්.

(2) ඌව පළාතේ ප්‍රධාන ලේකම් පළාත් ක්‍රීඩා මණ්ඩලයේ සභාපතිවරයා ලෙසත්, ක්‍රීඩා විෂය භාර ලේකම්වරයා පළාත් ක්‍රීඩා මණ්ඩලයේ ලේකම් ලෙසත් නිල බලයෙන් පත් විය යුතු ය.

පළාත් ක්‍රීඩා මණ්ඩලයේ කාර්යයන්

17. පළාත් ක්‍රීඩා මණ්ඩලයේ කාර්යයන් -

(1) ඌව පළාතේ ක්‍රීඩා වැඩසටහන පිළියෙල කිරීම සහ සම්බන්ධිකරණය කිරීම
(2) ඌව පළාතෙහි විනෝදාත්මක ක්‍රීඩා පහසුකම් සැපයීම
(3) ක්‍රීඩා වැඩසටහන ඉදිරිපත් කිරීම, සංවිධානය හා මනා ක්‍රියාකාරිත්වය පිළිබඳව පළාත් ක්‍රීඩා මණ්ඩලය මඟින් අමත්‍යවරයාට උපදෙස් දීම
(4) ඌව පළාතෙහි දක්ෂතම ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගැනීම, සම්මාන පිරිනැමීම, ආධාර ලබාදීම හා ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිළධාරින්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සම්බන්ධයෙන් පළාත් ක්‍රීඩා මණ්ඩලය අමාත්‍යවරයාට උපදෙස් ලබාදීම
(5) ක්‍රීඩාවන්හි විනය ආරක්ෂා කිරීම, අයහපත් හැසිරීම හා වැරදි ක්‍රියාවන් වැළැක්වීම හා ක්‍රීඩා පුහුණුව ඉහළ මට්ටමින් පවත්වා ගැනීම සඳහා අදාළ කරුණු පිළිබඳව පළාත් ක්‍රීඩා මණ්ඩලය විසින් අමාත්‍යවරයාට උපදෙස් දිය යුතු අතර ක්‍රීඩා භාණ්ඩ බෙදා හැරීම, ක්‍රීඩා කටයුතු වල උන්නතිය සඳහා කෙරෙන ව්‍යාපෘතින් ඇගයීම හා ක්‍රියාත්මක කිරීම, පළාත් ක්‍රීඩා උත්සවය සංවිධානය කිරීම සහ ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා උත්සව හා තරග සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් යොමු කරවීම පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් ලබාදීම.
(6) පළාත තුළ ක්‍රියාත්මක කරනු ලබන ක්‍රීඩා සමාජ,සංගම් ශක්තිමත් කිරීම, ක්‍රීඩා සංවර්ධනය සඳහා යටිතල පහසුකම් සැපයීම හා සංර්ධනය කිරීම පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් ලබාදීම.

18. ඌව පළාතට අයත් පරිපාලන දිස්ත්‍රික්කවල ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය නගා සිටුවීම, සංවර්ධනය කිරීම හා පාලනය කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් පළාත් ක්‍රීඩා මණ්ඩලයේ ද එකඟත්වය ඇතිව අමාත්‍යවරයාට උපදෙස් දීම පිණිස එක් එක් පරිපාලන දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලය නමින් මණ්ඩලය බැගින් මෙම ප්‍රඥප්තියේ දැක්වෙන විධිවිධානවලට අනුකූලව අමාත්‍යවරයා විසින් පිහිටුවනු ලැබිය හැකිය. දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩල පිහිටුවීම

19. දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලයේ සංයුතිය - දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලයේ සංයුතිය

(1) දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලය සමන්විත වනුයේ පහත සඳහන් සාමාජිකයින්ගෙනි.

(i) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව දිස්ත්‍රික් ලේකම්
(ii) දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරු
(iii) දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි
(iv) සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - ශාරීරික අධ්‍යාපන
(v) දිස්ත්‍රික් තරුණසේවා නිළධාරි
(vi) දිස්ත්‍රික්කයේ ක්‍රීඩා නිළධාරින්
(vii) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි
(viii) මෙම ප්‍රඥප්තියෙහි 17 වැනි වගන්තිය අනුව ලියාපදිංචිය ලබාගෙන ඇති ක්‍රීඩා සංගම්වල නියෝජිතයකු බැගින්
(ix) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියෝජිතයින් දෙදෙනෙකු

(2) දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලයේ සභාපතිවරයා ලෙස අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා ද, දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලයේ ලේකම්වරයා ලෙස අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ක්‍රීඩා නිළධාරිද නිල බලයෙන් පත්විය යුතු ය.

20. දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලවල වගකීම් හා කාර්ය භාරයන් - දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලයේ වගකීම් හා කාර්යයන්

(1) දිස්ත්‍රික්කය තුළ වූ ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලවල සම්බන්ධතාවය ගොඩනැගීම
(2) ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩල අතර ක්‍රීඩා ප්‍රගුණ කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ කටයුතු හා සම්බන්ධව පළාත් ක්‍රීඩා මණ්ඩලය මගින් අමාත්‍යවරයාට උපදෙස් දීම.
(3) දිස්ත්‍රික්කය තුළ වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් අතර ක්‍රීඩා කෞශල්‍ය ප්‍රගුණ කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ කාර්යයන් අමාත්‍යවරයාගේ අනුදැනුම මත ක්‍රියාත්මක කිරීම
(4) දිස්ත්‍රික් ක්‍රීඩා තරගාවලි සංවිධානය කිරීම හා පළාත් ක්‍රීඩා තරගාවලිය සඳහා ක්‍රීඩකයින් යොමු කිරීම.
(5) අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව කාර්යයන් පිළිබඳ කටයුතු සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

21. ඌව පළාතේ ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය නගා සිටුවීමට. සංවර්ධනය කිරීමට, ක්‍රීඩා කටයුතු සඳහා උනන්දු කරවීමට සහ පාලනය කරවීමට අදාළ කරුණු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලයට උපදෙස් හා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩල අමාත්‍යවරයා විසින් පිහිටුවනු ලැබිය හැකිය. ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩල පිහිටුවීම

22. ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයේ සංයුතිය - ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයේ සංයුතිය

1) ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයේ සංයුතිය පහත සඳහන් සාමාජිකයින්ගෙනි.

(i) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්
(ii) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රීඩා නිළධාරි
(iii) අදාළ පළාත් පාලන ආයතනයේ ලේකම්
(iv) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශාරීරික අධ්‍යාපන ගුරු උපදේශක
(v) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තරුණසේවා නිලධාරි
(vi) ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති
(vii) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියෝජිතයින් දෙදෙනෙකු

(2) අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයේ සභාපතිවරයා ලෙසත්, අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රීඩා නිලධාරී ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයේ ලේකම්වරයා ලෙසත් නිල බලයෙන් පත්විය යුතු ය.

ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයේ කාර්යයන්

23. ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලවල වගකීම් හා කාර්යභාරයන් -

(1) ප්‍රාදේශිය වශයෙන් දක්ෂතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඔවුන්ගේ ක්‍රීඩා කෞශල්‍ය ප්‍රගුණ කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ කාර්යයන් අමාත්‍යවරයාගේ අනුදැනුම මත ක්‍රියාත්මක කිරීම.
(2) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ තරග සංවිධානය කිරීම හා දිස්ත්‍රික් තරග සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් යොමුකරවීම.
(3) ප්‍රදේශයට ආවේණික ක්‍රීඩාවන් හඳුනා ගැනීම, එම ක්‍රීඩාවන් ව්‍යාප්ත කිරීම හා එම ක්‍රීඩාවන්ගේ ප්‍රවර්ධනයට අදාළ කටයුතු සිදු කිරීම
(4) අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව කාර්යයන් පිළිබඳ කටයුතු සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

ක්‍රීඩා මණ්ඩල පාලන නියෝග

24. පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලවල කාර්යයන් සඳහා අදාළ පාලන නියෝග -

(1) මණ්ඩලවල රැස්වීම්හි දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල හා සියළු කාර්ය අරහයා අමාත්‍යවරයා විසින් නියෝග පැනවිය හැක.

ක්‍රීඩා මණ්ඩල සාමාජිකත්ව නුසුදුසුතා

25. පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මණ්ඩලවල සාමාජිකත්වයට නුසුදුසුතාවයන්

(1) කිසියම් අධිකරණයකින් උමතු අයෙකු ලෙස තීරණය කිරීම
(2) කිසියම් අධිකරණයකින් බුන්වත් බවට තීරණය කිරීම
(3) සාපරාධි වරදවල් සම්බන්ධයෙන් අධිකරණයේ දඬුවම් ලාභියෙකු වීම
(4) ක්‍රීඩා ක්ෂේත්‍රයේ පහසුකම් හා යෙදවුම් සම්පාදනය, සැපයීම ආදී ව්‍යාපාරවල යෙදෙන්නෙකු හෝ කුමන අයුරකින් හෝ සම්බන්ධ වීම
(5) පාර්ලිමේන්තු, පළාත් සභා හෝ පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු හෝ සභිකයෙකු වීම

ක්‍රීඩා මණ්ඩල සාමාජිකත්ව ධුර කාලය

26. පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මණ්ඩලවල සාමාජික ධුර කාලය -

(1) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන අය මරණය නිසා කලින් සේවය අතහැර යාම නිසා, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නොවන්නට සාමාජිකයින්ගේ ධුර කාලය වසර 03 ක් වේ.
(2) තමන් විසින් පත් කළ සාමාජිකයෙකු ඉවත් කිරීම යෝග්‍ය යැයි අමාත්‍යවරයාට හැඟෙන්නේ නම් හේතු නොදන්වා එසේ සිදු කළ හැක.
(3) සේවා කාලය අවසන් වීම නිසා නතතුර අතහැර යන සාමාජිකයෙකු නැවත පත් කළ හැක.
(4) පුරප්පාඩුවන තනතුරකට පත් කරන අයෙකුට ධුරය දැරිය හැකි වන්නේ පූර්වගාමියාගේ ශේෂවී ඇති ධුර කාලය පමණි.

## *III* කොටස

*ඌව පළාතේ ක්‍රීඩා සමාජ හා සංගම් පිහිටුවීම*

ක්‍රීඩා සමාජ හා සංගම් පිහිටුවීම

27. ක්‍රීඩා සංගමයක් පිහිටුවිය හැකි යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පන්තියක් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය හැකිය. ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා පන්තිය සඳහා දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් හා පළාත් ක්‍රීඩා සංගමයක් බැගින් පිහිටුවිය හැකිය.

ක්‍රීඩා සමාජ හා සංගම් ලියාපදිංචිය

28. ඉහත 26 වගන්තිය යටතේ යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පන්තියක් නම් කරනු ලැබූ කල්හි -

(1) පළාත් අමාත්‍යාංශයෙන් හෝ පළාත් ක්‍රීඩා මණ්ඩලයෙන් ආධාර ලබාගැනීමට කැමති සියලුම ක්‍රීඩා සමාජ හා දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම සඳහා පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂකට ඉල්ලුම් කළ යුතු ය.

(2) දැනට යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා වර්ගයක් වෙනුවෙන් පළාත් සංගමයක් පවතින්නේ නම් එවැනි සංගමයක් මෙම ප්‍රඥප්තියෙහි මතු දැක්වෙන විධි විධානයන් යටතේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ යුතු ය.

(3) ලියාපදිංචිය පිළිබඳ අතෘප්තියට පත්වන යම් තැනැත්තෙක් වෙතොත් ඒ තීරණවලට හෝ ක්‍රියාවට විරුද්ධව අමාත්‍යවරයා වෙත දින 30 ක් ඇතුලත අභියාචනා කළ හැකිය.

29. ලියාපදිංචිය අවලංගු කිරීම -

1. ක්‍රීඩා සමාජයක හෝ සංගමයක නිළධාරීන්ගෙන් හෝ සාමාජිකයින්ගෙන් දූෂණ , විෂමාචාර, අක්‍රමිකතා සිදු වී ඇති බවට හෝ සිදුවීමට ඉඩ ඇති බවට වාර්තා වී ඇති විටක ඒ සඳහා ප්‍රතිකර්ම යොදන ලෙස අමාත්‍යාශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිළධාරියෙකු විසින් ලිඛිත නිවේදනයක් මගින් දැනුම් දෙනු ලැබූ විට එම නිවේදනයේ සඳහන්ව තිබිය හැකි කාලය තුළ දී එසේ ප්‍රතිකර්ම යෙදීමට අපොහොසත් වීම හෝ ප්‍රතිකර්ම යෙදීම නොසලකා හැරීම නිසා හෝ

ක්‍රීඩා සමාජ හා සංගම් ලියාපදිංචිය අවලංගු කිරීම

(i) අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා අකර්මණ්‍යව සිටීම, සහයෝගය නොදීම හෝ අවහිර කිරීම,

(ii) සංගමයේ යුතුකම් හා කාර්යයන් ඉටුකිරීම පැහැර හැරීම නිසා හෝ යම් ක්‍රීඩා සංගමයක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂප කිරීම හෝ එහි ලියාපදිංචිය අත්හිටුවීම , අවලංගු කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය.

(2) අත්හිටවනු ලැබූ හෝ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ නැතහොත් අවලංගු කරනු ලැබූ ක්‍රීඩා සංගමයක කාර්යයන් පවත්වාගෙන යාම සඳහා අමාත්‍යවරයාට තාවකාලික විධිවිධාන සැලැස්විය හැකිය.

(3) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුකූලව ලියාපදිංචි නොකරන ක්‍රීඩා සංගමයක් සඳහා මෙම ප්‍රඥප්තිය යටතේ ලැබිය යුතු ආධාර , පහසුකම් හෝ වෙනත් ප්‍රදානයකට සුදුසුකම් නොලබයි.

(4) යම් ක්‍රීඩා සමාජයක හෝ සංගමයක ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවල දී, අත්හිටවනු ලැබූ අවස්ථාවල දී හෝ අවලංගු කළ අවස්ථාවල දී එම ක්‍රීඩා සමාජය හෝ සංගමය සතු නිශ්චල, චංචල දේපල නියමිත කාලය තුළ අතුරු විධි විධාන මගින් නිශ්චය කරනු ලබන බලධරයන්ට බාරදීමට කටයුතු කළයුතු බවට අමාත්‍යවරයා විසින් නියෝග කළ හැක.

ක්‍රීඩා සමාජ හා සංගම් පිළිබඳ නියෝග

30. ක්‍රීඩා සංගම් හා සමාජ පිළිබඳ අමාත්‍යවරයාට පහත පරිදි නියෝග පැනවිය හැකිය.

(1) ක්‍රීඩා සමාජ හා සංගම් ලියාපදිංචි කිරීමේ දී අයකළ යුතු ගාස්තු
(2) සංගම්වල සංයුතිය හා සංස්ථාපනය
(3) ඒ සංගම්වල යුතුකම්, බලතල හා කාර්යයන්
(4) ඒ සංගම් තීරණවලට හෝ ක්‍රියාවලියන්ට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ කාර්යය පරිපාටිය

## *IV කොටස*

### *ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානය හා ක්‍රීඩා විද්‍යායතනය පිහිටුවීම*

31. අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන අරමුණු සඳහා ක්‍රීඩා ශිෂ්‍යත්ව එකක් හෝ වැඩි ගණනක් ඇති කළ හැකිය.

ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානය

(1) ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය හා විනෝදාංශ පිළිබඳ දැනුම වර්ධනය කරගැනීමට
(2) ක්‍රීඩා පිළබඳ හැකියාවන් ඇති අය සොයා බලා ඔවුනට ඒවා දියුණු කරගැනීමට අවස්ථාව සකසා දීමට
(3) හැකියාවන්ගේ උපරිම ප්‍රවර්ධනයට අදාළ වන තාක්ෂණික පුහුණුවීම් සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමට

32. අමාත්‍යවරයා විසින් ශිෂ්‍යත්ව ප්‍රදානය කළයුතු ආකාරය හා ඒ සම්බන්ධයෙන් පිළිබඳ අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය නියෝග මගින් පනවනු ලැබේ.

ක්‍රීඩා විද්‍යායතනය පිහිටුවීම

33. අමාත්‍යවරයා විසින් පහත සඳහන් කාර්යයන් සඳහා මෙහි මින්මතු ක්‍රීඩා විද්‍යායතනය යනුවෙන් සඳහන් කරන ලබන ක්‍රීඩා සංවර්ධන හා පුහුණු ආයතනයක් පිහිටවනු ලැබිය හැකිය.

34. ක්‍රීඩා විද්‍යායතනයේ කාර්යයන් හා වගකීම් -

(1) ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳ දැනුම උපදෙස් හා පුහුණුව ලබාදීම
(2) එම ක්‍රීඩා විද්‍යායතනයේ පුහුණුව ලබන්නන් විසින් ලබාගෙන ඇති ප්‍රවීනතාවය නිශ්චය කිරීම සඳහා විභාග පැවැත්වීම
(3) එම විද්‍යායතනය විසින් පවත්වනු ලබන විභාගවලින් සමත් වූ අයට අභිඥාණ පත්‍ර පිරිනැමීම සහ සහතික පත් ප්‍රදානය කිරීම
(4) ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශකයින් පුහුණු කිරීම

ක්‍රීඩා විද්‍යායතනයට ඇතුළත් කිරීමේ පරිපාටි

35. ක්‍රීඩා විද්‍යායතනය සඳහා ඇතුලත් කිරීමේ පරිපාටි හා වෙනත් කරුණු -

(1) ක්‍රීඩා පුහුණු ආයතනවලට ඇතුලත් කරගැනීමේ හා ක්‍රීඩා පුහුණු ආයතනවල අධ්‍යාපනය, පුහුණුව සහ විභාග පිළිබඳ පරිපාටි අමාත්‍යවරයාගේ එකඟත්වය සහිතව පළාත් ක්‍රීඩා මණ්ඩලය විසින් කලින් කලට සකස් කළ හැකිය.
(2) අමාත්‍යවරයාට,

(i) ක්‍රීඩා විද්‍යායතනයට පහසුකම් සැපයීම සහ පුහුණුව, නේවාසික පහසුකම් හා විද්‍යායතනයේ වෙනත් කාර්යයන් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම, ඒවා නඩත්තු කිරීම, උපකරණ සැපයීම සඳහා ද,
(ii) ක්‍රීඩා විද්‍යායතනයේ පුහුණුලාභින්ගේ විනය සහ සුබසාධනය ඇති කිරීම සහ විධිමත් කිරීම සඳහා ද,
(iii) ක්‍රීඩා විද්‍යායතනයේ අභිඥාණ පත්‍ර හා සහතික පත් ප්‍රදානය පිළිබඳ අවශ්‍ය විධිවිධාන සැලැස්වීමට බලය ඇත්තේය.

36. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ක්‍රියාත්මක කරන ආයතන වලට සේවාවන් ලබාදෙන පළාත් අමාතයාංශයෙන් පරිබාහිර නිළධාරින්ට නියමිත විධිවිධාන වලට අනුකූලව ක්‍රීඩා අරමුදලෙන් පාරිශ්‍රමිකයක් ගෙවිය හැක.

## *V* කොටස

### *වරදවල් හා දණ්ඩන*

37. යම් තැනැත්තෙකු, මෙම ප්‍රඥප්තියේ නියමයන් හෝ ඒ යටතේ පනවනු ලබන යම් නියෝගයක් කඩ කිරීම, පැහැර හැරීම, නොසලකා හැරීම මෙම ප්‍රඥප්තිය හෝ ඒ යටතේ පනවන නියෝග අනුව යම් කාර්යයන් පැවරී ඇති තැනැත්තෙකුට එම කාර්යය කිරීමට අවහිර කිරීම හෝ මෙහි දක්වා ඇති සේවාවන් ලබාගැනීම සඳහා සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම හෝ කළහොත් ඒ තැනැත්තා මෙම ප්‍රඥප්තිය යටතේ වරදකරුවෙකු වන්නේය.

(1) මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කරන සෑම තැනැත්තෙකුටම මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් වරදකරුවෙකු කරනු ලබන කල්හි රුපියල් 5000.00 ක දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයකට බන්ධනාගාර ගත කිරීම හෝ එකී දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.
(2) මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන යම් නියෝගයක් කඩ කිරීම හෝ පැහැර හැරීම හෝ නොසලකා හැරීම හෝ මෙම ප්‍රඥප්තිය හෝ ඒ යටතේ පනවන නියෝග අනුව ක්‍රියාත්මක නොවන යම් ආයතනයක් ඇත්නම් එම ආයතනයේ ක්‍රියාකාරිත්වය අමාත්‍යවරයා විසින් අත්හිටුවිය යුතු ය.

## *VI* කොටස

### පොදු විධිවිධාන

38. නියම කළ යුතු යැයි මෙම ප්‍රඥප්තිය මගින් නියමිත, නියෝග සෑදීමට මෙම ප්‍රඥප්තිය මගින් බලය දී ඇති, අවශ්‍ය විය හැකි සියලුම කාරණා සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය යුතු ය.

39. මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම හැකිතාක් ඉක්මනින් පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබ, සභාවේ යෝජනාවක් මගින් සංශෝධන සහිතව හෝ රහිතව අනුමත වූ කල්හි එකී අනුමැතිය *ගැසට් පත්‍රයෙහි* පළකල දින සිට හෝ තීරණය කරන ලද පසු දිනක සිට නියෝග බලාත්මක වීම ආරම්භ වේ.

40. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මකවන දින සිට 1997 අංක 2 දරන ඌව පළාත් ක්‍රීඩා ප්‍රඥප්තිය පරිච්ඡින්න වන අතර මෙතෙක් 1997 අංක 02 දරන ප්‍රඥප්තිය මගින් ගන්නා ලද ක්‍රියාකාරකම් සඳහා එමගින් අගතියක් නොවිය යුතුය. පරිච්ඡින්න කිරීම

41. මෙම ප්‍රඥප්තියෙහි අන්‍යාර්ථයක් අවශය නොවූ විට, වචනාර්ථ

(1) "අමාත්‍යවරයා" යන්න ඌව පළාතේ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයට අයත් ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා ද.
(2) "ආණ්ඩුකාරවරයා" යනු ඌව පළාතේ ආණ්ඩුකාරවරයා ද
(3) "ලේකම්වරයා" යනු ඌව පළාතේ පළාත් සභාවේ ක්‍රීඩා විෂය භාර ලේකම්වරයා ද
(4) "ක්‍රීඩා හෝ ක්‍රීඩාව" යනුවෙන් ප්‍රඥප්තියට අදාළ පරිදි අමාත්‍යාංශ ලේකම් විසින් පිළිගනු ලබන සියලු අන්දමේ ක්‍රීඩා, කෙළි සෙල්ලම්, විනෝද කාර්යයන්, ශාරීරික අභ්‍යාස පුහුණු, ශාරීරික සංවර්ධනය සහ අභ්‍යාස ද .
(5) "පළාත් සභාව" යනු ඌව පළාතේ පළාත් සභාව ද
(6) "ක්‍රීඩා සමාජය, සංගමය" යනු ප්‍රඥප්තියට අදාළ පරිදි ඕනෑම ක්‍රීඩාවක පුහුණු හා ක්‍රීඩා කටයුතු නැංවීමේ කාර්යය සඳහා පිහිටවනු ලබන සමාජයක් හෝ සංගමයක් ද

අදහස් වේ.

42. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

04-250

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2 - PG 001228